# 6 පරිච්ඡේදය

## ආරාම පාලනය

පොළොන්නරු, දඹදෙණි කතිකාවත්වල ආරාම පාලනය සම්බන්ධයෙන් හෙළිවන තොරතුරු ඉතාම අල්ප ය. එයිනුත් පොළොන්නරු කතිකාවතේ ඒ පිළිබඳ තොරතුරු සඳහන්වන්නේ ඉතා මඳ වශයෙනි. පොළොන්නරු, දඹදෙණි කාලවල ආරාම පාලනය ගැන ලියැවුණු සෙල්ලිපි ද ඉතා විරල ය. අනුරාධපුර යුගයේ අවසානය දක්වා දියුණු ආරාම පාලන සම්ප්‍රදායක් පැවති බව ප්‍රකට කරුණකි. එහෙත් එම පාලන සම්ප්‍රදාය සොළී ආධිපත්‍යය පැවති කාලයේ දී සහ I විජයබාහුගෙන් (ක්‍රි. ව. 1055-1120) පසුව ඇති වූ වියවුල් කාලයේ දී අනුක්‍රමයෙන් පිරිහී ගිය බව පෙනේ. පොළොන්නරු කාලයේ දී වුව ද එහි අලුත් දියුණුවක් ඇති වූ බවට සාධක විරල ය. විශේෂයෙන් මාඝගේ පාලන සමයේ මුල් භාගයේ ඇති වූ වියවුල් හේතුකොටගෙන ආරාම පාලනය සම්පූර්ණයෙන් පිරිහී යන්නට ඇත.

අනිත් අතට අනුරාධපුර යුගයේ අවසාන භාගය තෙක් දියුණු වී ආ ආරාම පාලන ව්‍යවස්ථා ඇතුළත් වැදගත් සෙල්ලිපි දක්නට ලැබෙන්නේ මහාවිහාර සම්ප්‍රදායෙන් පරිබාහිර වූ අභයගිරි, ජේතවන දෙපාර්ශ්වයට අයත් විහාරස්ථානවල ය. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය, V කාශ්‍යපගේ (ක්‍රි. ව. 914-923) අනුරාධපුර පුවරු ලිපිය, IV මිහිඳුගේ (ක්‍රි. ව. 956-972) මිහින්තලා පුවරු ලිපි දෙක සහ IV මිහිඳුගේ ජේතවනාරාම පුවරු ලිපිය[1] ඊට නිදසුන් ය. ව්‍යවස්ථා අතින් ඉහත දැක්වූ සෙල්ලිපිවලට ඇති සම්බන්ධය සලකාවිට ආරාම පාලන ව්‍යවස්ථා ඇතුළත් ප්‍රකට ලිපියක් වූ IV සේනගේ (ක්‍රි. ව. 954-956) කාළිදිය පොකුණ සෙල්ලිපිය[2] ද ජේතවන, අභයගිරි දෙපාර්ශ්වයෙන් එකකට අයත් වී යැයි අනුමාන කළ හැකි ය. මහාවිහාර සම්ප්‍රදායට අයත් විහාරස්ථානවල එතරම් දියුණු ආරාම පාලන ව්‍යවස්ථා තිබී වූ බවක් නො පෙනේ. පොළොන්නරු කාලයේ සහ දඹදෙණි කාලයේ දියුණු ආරාම පාලන ව්‍යවස්ථා දක්නට නැත්තේ එතැන් සිට මහාවිහාර සම්ප්‍රදාය බලවත්ව නැඟී සිටි නිසා ද විය හැකි ය. දඹදෙණි කාලයෙහි පිහිටුවන ලද ගලපාත විහාර සෙල්ලිපිය[3] ඇතැම් විට, ඒ කාලයෙහි ආරාම පාලනය හා සම්බන්ධ තොරතුරු ගැන ලියැවුණු එක ම අභිලේඛනය විමට පුළුවන. එය පවා ගලපාත විහාරයට ලැබුණු ඉඩකඩම්, දේපළවල සහ සේවක සේවිකාවන්ගේ නාම ලැයිස්තුවකට සීමා වන හෙයින් එකල ආරාම පාලනය පිළිබඳ අවබෝධයක්

---

1. **EZ** I, No.1. pp. 1-9, No.4, pp. 41-57, No. 7, (Slab A) pp. 75-87, 91-94, 98-107; III. No. 27, pp. 210-269.
2. **EZ**. III, No. 27, pp. 260-269.